**ශීර්ෂ 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණය කළ මතය

ශීර්ෂ 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වියදම් සාරාංශ SA -10 ආකෘතිය අනුව 2022 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 06 ක වියදම් එකතුව රු.258,306,686 ක් දක්වා තිබුණද දෙපාර්තමේන්තුවේ වැය ලෙජරය අනුව එය රු.88,218,525 ක් වූයෙන් රු. 170,294,265 ක වෙනසක් පැවතුණි. | වැය ලෙජර නිවැරදිව නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | දෙපාර්තමේන්තු පොත් නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ii) | වියදම් සාරාංශ SA -10 ආකෘතිය අනුව 2022 දෙසැම්බර් 31දිනට වැය විෂයන් 06 ක ඉතිරිවීම් එකතුව රු.23,193,310 ක් දක්වා තිබුණද දෙපාර්තමේන්තුවේ වැය ලෙජරය අනුව එය රු.38,281,471 ක් වූයෙන් රු.15,294,267 ක වෙනසක් පැවතුණි. | වැය ලෙජර නිවැරදිව නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | දෙපාර්තමේන්තු පොත් නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති බිල්පත්රු.2,911,513 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුවද නියැදි පරීක්ෂාවට අනුව රු.6,034,453 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා වවුචර්පත්වල පැවති අඩුපාඩු හේතුවෙන් CIGAS බැරකම් ලේඛනයේ සටහන් කිරීමට නොහැකි වූ බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු කැබ් රථ 04 කට රු.1,400,000 ක් වැයකර සවි කරන ලද කැනපි 04 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,911,513 ක බැරකම් ලේඛනයක සටහන් කර නොතිබුණි. | වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන ඉතිරිය හා වියදම සටහන් කර විසර්ජන වැය ලෙජරය තුලනය කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම (රු.)** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදය 4 ඡේදය. | 16,066,323 | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා විදේශ ගත වූ නිලධාරීන් 08 දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම. | අය කර ගැනීම සඳහා ගත හැකි පියවර ක්‍රියාත්මක කර තිබෙන බවත් එම උත්සහයන් තවදුරටත් කරගෙන යන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 07 ක ප්‍රගතිය සියයට 50ට වඩා අඩු මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොමැත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්කයකන් ලගා කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කුණ්ඩසාලේ පශු විමර්ශණ මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඉලක්ක හා දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පරීක්ෂාවේදි ක්‍රියාකාරකම් 18 ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 55 දක්වා අඩු මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොමැත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්කයන් ළගා කර ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල කුර හා මුඛ රෝග එන්නත් දේශිය නිෂ්පාදනය වඩි 359,760 ක් ලෙස දේශීය අවශ්‍යතාවයෙන් සියයට 25 ක් තරම් අවම මට්ටමක පැවති අතර, ආනයනය සියයට 51 සිට සියයට 91 ක් තරම් ඉහල මට්ටමකින් වඩි 2,299,900 ක් ආනයනය කර තිබුණු අතර ඒ සඳහා රු.89,344,215 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව දේශිය නිෂ්පාදනය වැඩි කිරීමකින් තොරව ආනයනය වැඩි කිරීමේ ප්‍රවනතාවයන් නිරීක්ෂණය විය. | එන්නත් නිපදවීමට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හිඟතාවය හේතුවෙන් ආනයන ප්‍රමාණය වැඩිවූ බව. | දේශීය නිෂ්පාදනය වැඩිකර ආනයනය පාලනය කිරීමට කටයුතු කල යුතුය. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරයේ වැඩි දියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2018 අගෝස්තු 24 දින තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකුට 2018 දෙසැම්බර් 29 දිනට පෙර වැඩ අවසන් කිරීම සඳහා රු.3,273,873 ක වටිනාකමකට ගිවිසුම්ගතව කොන්ත්‍රාත්තුව පිරිනමා සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.1,382,766 ක් ගෙවා තිබුණි.එසේ වුවද කොන්ත්‍රාත්තුවේ අළුත්වැඩියා කිරීම් අවසන් නොකර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබියදී 2020 අගෝස්තු 11 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි.කෙසේ වුවද රසායනාගාරයේ අලුත්වැඩියාවන් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් නියමිත අයුරින් ජීවාණුහරණ ක්‍රියාවලියක් සිදු කර ගැනීමට නොහැකි වීමත් රසායනාගාරයේ පර්යේෂණ කටයුතු, එන්නත් සාර නිෂ්පාදන කටයුතු බලවත් අපහසුතා සහිතව සිදු කරන බවත් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදීද නැවත අලුත්වැඩියා කිරීම් ආරම්භ කර නොතිබුණි. | වර්තමානයේ පවතින අවශ්‍යතා හඳුනා ගෙන ඇස්තමේන්තු ගත කිරීම් ඉටු කිරීමට කටයුතු කරන බව. | විධිමත් අධීක්ෂණයකින් අලුත්වැඩියා කටයුතු අවසන් කර ගත යුතුය. |
| (ආ) | පශු පර්යේෂණ ආයතනය ඉදිරිපිට ඇති රජයේ නිවාස අළුත්වැඩියා කිරීම වෙනුවෙන් 2018 සැප්තැම්බර් 22 දින වැඩ ආරම්භ කර 2019 පෙබරවාරි 20 දිනට පෙර වැඩ අවසන් කිරීම සඳහා රු. 3,334,567 ක වටිනාකමකට ගිවිසුම්ගතව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.මෙම කර්මාන්තයේ වැඩ සියයට 35 ක් පමණ ඉදිකිරීමට තිබියදී කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට රජයේ නිවාසයේ වැඩ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බවත් වර්තමානයේ පවතින අවශ්‍යතා හඳුනා ගෙන ඇස්තමේන්තු ගත කිරීම් ඉටු කිරීමට කටයුතු කරන බව. | විධිමත් අධීක්ෂනයකින් යුතුව අලුත්වැඩියා කටයුතු අවසන් කර භාවිතයට ගත යුතුය. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි මූල්‍ය ප්‍රකාශන වාර්ෂික කාර්යසාධන වාර්තාව සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.467,236 ක යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ 07ක් හා වටිනාකම හඳුනා ගත නොහැකි යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ 3 ක් වසර 2 ත් 10ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | Electronic Treadmill උපකරණ දෙක අලුත්වැඩියා කළ නොහැකි බැවින් අපරහණය කිරීමට කටයුතු කරන බවත් ඉදිරියේදි අවශ්‍ය ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ලද පසුව ඉතිරි උපකරණ අලුත්වැඩියා කරන බව. | අපහරණය කල යුතු වත්කම් අපහරණය කිරීමටත් අනෙකුත් උපකරණ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් කටයුතු කල යුතුය. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේ 2022 ජනවාරි 07 දින සිට 2022 සැප්තැම්බර් 29 දින දක්වා කාල පරාසය තුල රු. 1,483,020 ක එළුවන් හා එළිච්චියන් 13 දෙනෙකු මිය ගොස් තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) පරිදි පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මිය ගිය සමහර සතුන් සම්බන්ධයෙන් මේ වන තෙක් ආයතන අංශය වෙත වාර්තා වී නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල පරීක්ෂණයන් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අධියර 2ක් යටතේ රු.15,072,388 ක් වැයකර අඛණ්ඩ අධ්‍යාපන ආයතනය සතු ආපන ශාලාව පුළුල්කර ගොඩනැගිල්ල ඉදිකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටද ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. මේ හේතුවෙන් ගොඩනැහිල්ලට සවිකර තිබුණු රු.1,613,051 ක උපකරණ හා උපාංග භාවිතයෙන් තොරව වගකීම් කාලය ඉකුත්වීම, වායු සමීකරණ යන්ත්‍ර අක්‍රීය වීම හේතුවෙන් නිෂ්කාර්යය වී තිබුණි. | ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට 2022 වර්ෂයේදීද නොහැකි වූ බවද ඇතැම් අවස්ථාවලදී සීමාවාසික කථන විභාගය සඳහා එම ගොඩනැගිල්ල භාවිතා කරන ලද බව . | ගොඩනැගිලි ඵලදායිව උපයෝජනය කළ යුතුය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උසස් වර්ගයේ එළුවන් අභිජනනය කර ගොවීන්ට හා ගොවිපල වලට සතුන් නිකුත් කිරීමේ අරමුණින් 2019 අප්‍රේල් මාසයේදී බෝයර් වර්ගයට අයත් එළුවන් පිරිමි සතුන් 10 ක් සහ ගැහැණු සතුන් 90 දෙනකු රු.34,983,630 ක් වැයකර ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කර තිබුණු අතර,රට තුල පරිසර තත්ත්වවලට අනුවර්තනය නොවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 13 දිනට රු. 11,532,938 ක ආනයනික පිරිමි එළුවන් 06 දෙනකු සහ ගැහැණු එළුවන් 25 දෙනකු ඇතුළත්ව සතුන් 31දෙනකු මියගොස් තිබුණි. සතුන්ගේ පාරම්පරික සංවේදි පැවැත්මට සුදුසු මට්ටම් තක්සේරු නොකර සතුන් ආනයනය කර ගාල් කර තැබීම තුලින් ආනයනික ගැහැණු සතුන් 04 දෙනකුත් දීර්ඝ කාලීන රෝගාබාධ වලට ලක් වී ඇති අතර විවිධ වෛයිරස් ආසාධනයන්ගෙන් පෙලෙන සතුන් 33 ක්ද අපේක්ෂා නොකල රෝග වාහකයන්ට ගොදුරු වී තිබුණි. එසේම 2019 වසර සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිට සතුන් 29 දෙනෙකු පමණක් ක්ෂේත්‍රයට මුදා හැරීමට හැකිවී ඇති බැවින් මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගෙන නොතිබුණි. | ආනයනික රට තුල පරිසර තත්ත්ව වලට අනුවර්තනය වන මොහොතේ දී මෙවැනි සතුන් මියයාම අපේක්ෂිත තත්ත්වයක් බව. | සතුන්ගේ පාරම්පරික සංවේදි පැවැත්මට සුදුසු මට්ටම් තක්සේරු කර සතුන් ආනයනය කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලය තත්‍ය කාර්යය මණ්ඩලය සැසදීමේදී පුරප්පාඩු 206 ක් පැවතුණි. ඒ අතරින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම තුළ තනතුරු 23 ක පුරප්පාඩු 65 ක් පැවති අතර අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 120ක් පමණක් වුවද 133 ක් අනුයුක්ත කර තිබුණි. ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 112 ක් පැවති බැවින් ක්ෂේත්‍ර කාර්යයන් කරගෙන යාමේදී අපහසුතා පැන නැගී තිබුණි. | දැනට වැඩ බැලීම සඳහා නිලධාරින් පත් කර ඇති බව හා අදාල නිලධාරීන් අනුමත කරදෙන ලෙස ඉල්ලීම් සිදුකර ඇති බව. | අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවීමට අනුමත කාර්යය මණ්ඩලය තුල කටයුතු කළ යුතුය. |